# 2.2
# චින්තන නියම ප්‍රායෝගිකව භාවිතා කරයි.



<u>ඉගෙනුම් පල</u>

⇒ විවිධ චින්තන නියමයන් පෙළ ගස්වයි.

⇒ තාර්කික නියමයන් හා විද්‍යාත්මක නියම අතර වෙනස පෙන්වා දෙයි.

⇒ පර්යාප්ත හේතු මූලධර්මය, සාම්ප්‍රදායික චින්තන මූලධර්ම යන්නෙන් වෙන්කර දක්වයි.

⇒ සප්‍රමාණ චින්තනයෙහිලා චින්තන මූලධර්මයන්හි වැදගත්කම විනිශ්චය කරයි.

අන්තර්ගතය සකස් කිරීම : අනුෂා නන්දනසිංහ මිය , ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර

පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල උඩහේන්තැන්න

අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## චින්තන නියම

චින්තන නියම යනු පටු අර්ථයෙන් දැක්වුවහොත් තර්කයට පදනම්ව ඇති යම් යම් මූලික වූත් අවශ්‍යවූත් පිළිගැනීමය. එබැවින් චින්තන නියමයන් උල්ලංඝනය කරමින් සප්‍රමාණ තර්කයක් ගොඩනැගෙන්නේ නැත. සෑම සප්‍රමාණ තර්කයක් තුළම එය ආරක්ෂා වේ. ඇරිස්ටෝටල්ගේ කාලයේ සිට පැවත එන චින්තන නියම 3 කි.

- තාදාත්ම්‍ය නියමය (අනන්‍යතා නියමය)
- මධ්‍යබහිෂ්කෘත නියමය (නිර්මධ්‍ය නියමය)
- අවිරෝධතා නියමය (අවිසංවාදී නියමය)

මීට අමතරව පසු කාලීනව ද්විත්ව නිශේධන නියමය සහ පර්යාප්ත හේතු මූලධර්මය වශයෙන් තවත් චින්තන නියම තුනක් එක් වී ඇත.

### තාදාත්ම්‍ය නියමය

යම් සාකච්ඡා විෂයක යම් දෙයක් , යම් වස්තුවක් හැම කල්හිම එපරිද්දෙන්ම පැවතිය යුතුය. සරලව කිවහොත් "අ" හැමවිටම "අ" වේ. (යම් දෙයක් P වේ නම් එය හැම කල්හිම P වේ. P → P)

උදා - පියල් නැමැත්තා හැම කල්හිම පියල් වේ.

### මධ්‍යබහිෂ්කෘත නියමය

අතරමැදි තත්වය බැහැර කරන හොඳම පිළිවෙල මෙයින් දක්වයි. ඒ අනුව යම් දෙයක් අන්ත දෙකකින් එකක පිහිටයි. එක්කෝ "අ" "බ" වේ. එක්කෝ "බ"නොවේ. (P v ~ P)

උදා - චිත්තිකරු එක්කෝ වැරදිකරුය. නැත්නම් නිවැරදිකරුය.

### අවිසංවාදී නියමය

එකිනෙකට නොපෑහෙන කරුණු දෙකක් එකවිට සත්‍ය නොවන බව මෙයින් ප්‍රකාශ කරයි. ඒ අනුව "අ" "බ" වීමත් "බ" නොවීමත් එකවිට සිදු විය නොහැක. වේ. ~( P Λ ~ P)

උදා - යම් අවස්ථාවක පෑන ලියවීමත් නොලිය වීමත් එකවිට සිදුවිය නොහැක.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ද්විත්ව නිශේධන නියමය

යම් ප්‍රස්තුතයක් සත්‍ය නම් එය අසත්‍ය විය නොහැක.(P → ~~ P)

උදා - P නැමැති ප්‍රස්තුතය සත්‍ය නම් P අසත්‍යයක් නොවේ.

විත්තිකරු වැරදිකරු නම් විත්තිකරු නිවැරදිකරු නොවේ.

## පර්යාප්ත හේතු මූලධර්මය

මෙය ලයිබ්නීස් නැමැත්තා ඉදිරිපත් කළේය. මෙයින් ප්‍රකාශ කරන්නේ ලොව විද්‍යාමාන වන යම් දෙයක් වේ ද සත්‍ය යැයි පිළිගැනෙන යම් කරුණක් වේ ද ඒ දෙය නොහොත් ඒ කාරණය එපරිද්දෙන් මිස අන් පරිද්දකින් නොවීමට පර්යාප්ත හේතුවක් තිබිය යුතුය.

උදා - ගින්නට ළං කළ අත පිළිස්සේ.

100 $C^0$ දී ජලය වාෂ්ප බවට පත්වේ.

මෙම නියමය බාහිර ලෝකයේ පවතින තත්වයන් පිළිබඳව විමසීමක් කරන බැවින් අනෙකුත් චින්තන නියම සමඟ සමාන මට්ටමින් සැලකිය නොහැක.

අන්තර්ගතය සකස් කිරීම : අනුෂා නන්දනසිංහ මිය , ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි

Copyright © www.e-thaksalawa.moe.gov.lk